රහස්‍යතා නිවේදනය

අනුවාදය – 4.0

අපි ඔබේ පුද්ගලික දත්ත පිළිබඳ සැලකිලිමත් වෙමු

අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් යනු අලියාන්ස් ලංකා ලෙස හඳුන්වන ජීවිත නොවන රක්ෂණ සමාගමක් වන අතර, ශ්‍රී ලංකාව තුළ ජීවිත නොවන රක්ෂණ කටයුතු සිදුකිරීමට බලපත්‍රය සහිත අලියාන්ස් SE හි පූර්ණ අනුබද්ධිත සමාගමක් වේ. ඔබගේ පුද්ගලිකත්වය සුරැකීම අපගේ මූලික ප්‍රමුඛතාවයකි. පුද්ගලික දත්ත රැස් කරන්නේ කෙසේ ද සහ රැස් කරන්නේ කුමන ආකාරයේ දත්ත ද, ඒවා රැස් කිරීමට හේතුව සහ ඒවා බෙදා ගන්නේ කා සමඟ ද හෝ හෙළිදරව් කරන්නේ කාට ද යන්න මෙම රහස්‍යතා දැන්වීම මගින් පැහැදිලි කරයි. කරුණාකර මෙම නිවේදනය හොඳින් කියවන්න.

2022 අංක 09 දරන **පුද්ගලික දත්ත ආරක්ෂණ පනතේ** (PDPA) **අවශ්‍යතාවලට අනුකූලව මෙම රහස්‍යතා නිවේදනය යාවත්කාලීන කර ඇති බව කරුණාවෙන් සලකන්න.**

1. දත්ත පාලකයා යනු කවරෙක් ද?

දත්ත පාලකයෙකු යනු පුද්ගලික දත්ත කඩදාසි හෝ ඉලෙක්ට්‍රොනික ලිපිගොනු වල තබා ගැනීම සහ භාවිත කිරීම පාලනය කරන සහ ඒ සඳහා වගකිව යුතු පුද්ගලයා හෝ නීත්‍යානුකූල පුද්ගලයෙකි. අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් යනු අදාළ දත්ත ආරක්ෂණ නීති සහ රෙගුලාසි මගින් අර්ථ දක්වා ඇති දත්ත පාලකයයි. මෙම රහස්‍යතා නිවේදනයේ අවසාන කොටසින් දත්ත පාලකගේ සම්බන්ධතා විස්තර සොයා ගත හැකි ය.

2. රැස් කරනු ලබන පුද්ගලික දත්ත මොනවාද?

අපි ඔබ පිළිබඳ විවිධ වර්ගයේ පුද්ගලික දත්ත පහත පරිදි එක් රැස්කර සකසන්නෙමු:

- IP ලිපිනය
- **ඔබ අපව නරඹන ලද වෙබ් අඩවිය**
- **භාවිත කරන ලද බ්‍රවුසර මෘදුකාංග වර්ගය**
- **ඔබ විසින් නරඹන ලද අලියාන්ස් වෙබ් අඩවි පිටු**
- ඔබ අලියාන්ස් වෙබ් අඩවියට ඔබ පිවිසි දිනය සහ කාලසීමාව
- මූලික පුද්ගලික තොරතුරු (සම්පූර්ණ නම, ලිපිනය, උපන් දිනය, ස්ත්‍රී පුරුෂ භාවය ආදිය)
- ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍ර විස්තර
- සබඳතා විස්තර
- ඊ මේල් ලිපිනය
- අධ්‍යාපනික සහ වෘත්තීය පළපුරුද්ද සහ අනුබද්ධ කිරීම්
- ව්‍යාපාර කටයුතු

- ගමන් සහ වියදම් තොරතුරු
- මූල්‍ය විස්තර (උදා. ණය/ඩෙබිට් කාඩ්පත් සහ බැංකු ගිණුම් විස්තර ආදිය)
- හඳුනාගැනීමේ පරීක්ෂණ සහ පසුබිම් තොරතුරු සත්‍යාපනය
- ඡායාරූප සහ වීඩියෝ තොරතුරු (ඡායාරූප, CCTV ආදිය)
- වෙනත් තොරතුරු (උදා: පවුල, ජීවන රටාව, සමාජ තත්වයන් ආදිය)

අපි ඔබ පිළිබඳව "සංවේදී පුද්ගලික දත්ත" එකතු කර සකසන්නෙමු, උදාහරණයක් ලෙස වෛද්‍ය වාර්තා හෝ මරණ සහතික වලින් ලැබෙන දත්ත, ඔබේ හිමිකම් ඉල්ලීම් පිළිබඳ ඉතිහාසය, ඕනෑම අපරාධ වරදක්, ඔබේ ජානමය හෝ ජෛවමිතික දත්ත යනාදිය.

3. අපි ඔබගේ පුද්ගලික දත්ත ලබාගෙන භාවිත කරන්නේ කෙසේ ද?

අපි අපගේ නීත්‍යානුකූල අවශ්‍යතා සහ/හෝ අපගේ නීතිමය බැඳීම්වලට අනුකූල වීම මත පදනම් වූ ඔබේ පුද්ගලික දත්ත රැස් කර භාවිතා කරන්නෙමු.

- රක්ෂණ ගිවිසුම් පරිපාලනය
- ණය අයකර ගැනීම් පරිපාලනය කිරීමට;
- අලියාන්ස්හි තාක්ෂණික පරිපාලනය, පර්යේෂණ සහ සංවර්ධනය සඳහා;
- පාරිභෝගික සහ පරිශීලක පරිපාලනය සහ අලෙවිකරණය සඳහා;
- ව්‍යාපාරික සබඳතා පවත්වා ගැනීමට;
- අපගේ ව්‍යාපාරික සබඳතා සම්බන්ධයෙන් පර්යේෂණ සහ විශ්ලේෂණ පැවැත්වීම;
- ඔබ අලියාන්ස් වෙබ් අඩවියට පිවිසෙන විට හෝ අපගේ පුවත් පත්‍රිකාවට හෝ තැපැල් ලැයිස්තු වෙත ග්‍රාහකත්වය ලබා ගන්නා විට අපගේ විශේෂ අවස්ථා, සේවාවන්, නිෂ්පාදන සහ ප්‍රවෘත්ති පිළිබඳව ඔබට දැනුම් දීමට;
- සුරැකුම්පත් නීතිය, පොදු සමාගම් ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා සහ අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූල වීමට පහසුකම් සැලසීම;
- වංචා වැළැක්වීම සහ අනාවරණය සඳහා;
  ඕනෑම නෛතික බැඳීම් වලට අනුකූල වීම (උදා. බදු, ගිණුම්කරණය සහ පරිපාලන වගකීම්)

ඉහත දක්වා ඇති අරමුණු සඳහා, අපි පොදු සහ වාණිජ දත්ත සමුදායන්, තැරැව්කරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන්, අතරමැදියන්, නීතීඥයින් වැනි තුන්වන පාර්ශ්වවලින් ඔබ පිළිබඳව ලැබෙන පුද්ගලික දත්ත සකස් කරන්නෙමු.

ඔබේ පුද්ගලික දත්ත සැකසීමට ඔබේ කැමැත්ත අවශ්‍ය වන්නේ කුමන අවස්ථාවේදැයි අපි ඔබට දන්වන්නෙමු. එසේ නොමැතිනම්, අපි ඔබගේ පුද්ගලික දත්ත අපගේ නීත්‍යානුකූල ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලීමට (සේවාලාභීන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම, අලියාන්ස් පිළිබඳ යාවත්කාලීනයන් සහ තොරතුරු සැපයීම, විශේෂ අවස්ථා සංවිධානය කිරීම සහ සත්කාරකත්වය

සැපයීම, සහ වෙළඳපල පර්යේෂණ සහ විශ්ලේෂණ පැවැත්වීම ඇතුළුව) හෝ නීතිමය බැඳීමකට අනුකූල වීමට අවශ්‍ය තැන්වල දී සකස් කරන්නෙමු.

ඊට අමතරව, අපි ඔබ සමඟ ගිවිසුමකට එළැඹීමට හෝ ඔබ සමඟ පවතින ගිවිසුමක් යටතේ අපගේ වගකීම් ඉටු කිරීමට ඔබේ පුද්ගලික දත්ත සැකසීමට ද හැකි ය. පුද්ගලික දත්ත භාවිත කිරීමේ දී අදාළ නීති සහ රෙගුලාසි වලට අලියාන්ස් ගරු කරයි.

දත්ත පාලකය ස්වයංක්‍රීය පුද්ගල තීරණ ගැනීමට (ප්‍රොෆයිලය සැකසීම ඇතුළුව) තීරණය කිරීමේ දී, එවැනි තීරණයක් ගැනීමට අදාළ තර්කය පිළිබඳ විස්තර, දත්ත විෂය සඳහා එවැනි සැකසීමක වැදගත්කම සහ අපේක්ෂිත ප්‍රතිවිපාක මෙම රහස්‍යතා නිවේදනය හරහා හෙළිදරව් කෙරේ.

4. කුකීස් (Cookies) අපගේ වෙබ් අඩවියේ භාවිතා වේ ද?

ලුහුබැඳීමේ තාක්ෂණය අපට අපගේ වෙබ් අඩවියේ උපයෝගීතාව කළමනාකරණය කිරීමට සහ වැඩිදියුණු කිරීමට උපකාරී වේ, උදාහරණයක් ලෙස ඔබේ පරිගණකය සහ අප අතර අතීතයේ කිසියම් සබඳතාවයක් පැවතුනි ද යන්න හඳුනා ගැනීම සහ අපගේ වෙබ් අඩවියේ වඩාත් ජනප්‍රිය කොටස් හඳුනා ගැනීම.

කුකීස් භාවිතය පිළිබඳ වඩාත් සවිස්තරාත්මක විස්තරයක් මත පදනම්ව කැමැත්ත ලබා දීම ඇතුළුව ඔබේ කුකීස් මනාප කළමනාකරණය කිරීමට අපගේ කුකීස් කළමනාකරණ මෙවලම උපකාරී වේ. අදාළ කුකීස් කළමනාකරණ මෙවලම වෙත සබැඳිය ඔබට පහතින් සොයා ගත හැකි ය. කලින් සඳහන් කළ මෙවලම භාවිතයෙන් ඇතැම් කුකීස් භාවිතය සඳහා ඔබේ කැමැත්ත ඔබට ඕනෑම වේලාවක ඉල්ලා අස්කර ගත හැකි ය.

ඔබ ඔබගේ කුකී සැකසුම් සුරකින විට, ඒවා ඔබ අනාගතයේ දී අපගේ වෙබ් අඩවියට පිවිසීම් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය. කෙසේ වෙතත්, අලියාන්ස් ලංකා හි පාලනයෙන් ඔබ්බට ගිය තාක්ෂණික හේතූන් මත, මෙය සහතික කළ නොහැකි ය. උදාහරණයක් ලෙස, ඔබ ඔබේ බ්‍රවුසරය යළි සකසන්නේ නම්, ඔබේ කුකීස් මකා දැමුවහොත් හෝ වෙනත් බ්‍රවුසරයකින් හෝ උපාංගයකින් අපගේ වෙබ් අඩවියට පිවිසෙන්නේ නම්, ඔබේ කුකී සැකසුම් නැති වී යා හැකි ය. අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීමට, සමහර රටවල ඔබ මුලින්ම වෙබ් අඩවියට පිවිසෙන විට ඔබේ කුකී සැකසුම් තහවුරු කිරීමට ඔබෙන් ඉල්ලා සිටිනු ඇත. අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම පිණිස, සමහර රටවල් ඔබ මුලින්ම වෙබ් අඩවියට පිවිසෙන විට ඔබේ කුකී සැකසුම් තහවුරු කරන ලෙස ඔබට පවසනු ඇත. ඔබ සිටින්නේ ඔබේ කුකී සැකසුම් ස්වයංක්‍රීයව සැකසීමට අවශ්‍ය වන රටක නම්, අනාගතයේ දී ඔබ වෙබ් අඩවියට පිවිසෙන විට ඒවා නැවත සකසන ලෙස ඔබෙන් ඉල්ලා සිටිනු ඇත.

බොහෝ අවස්ථාවල දී ඔබට ඔබේ බ්‍රවුසරය භාවිතයෙන් ලුහුබැඳීමේ තාක්ෂණයන් පාලනය කළ හැකි ය. කරුණාකර ඔබගේ බ්‍රවුසරයේ සැකසුම් මඟින් හැකි අවස්ථාවන්හි දී ඔබට අනතුරු ඇඟවීමට සහ/හෝ ලුහුබැඳීමේ තාක්ෂණයන් (කුකීස් වැනි) පිළිගැනීමට කැමති ද යන්න පිළිබිඹු වන බවට සහතික

වන්න. ඔබේ බ්‍රවුසරයේ විශේෂී හැකියාවන් සහ ඒවා භාවිත කරන ආකාරය පිළිබඳ උපදෙස් සාමාන්‍යයෙන් ඔබේ බ්‍රවුසරයේ අත්පොතෙන් හෝ උපකාරක ගොනුවෙන් සොයාගත හැකි ය.

ලුහුබැඳීමේ තාක්ෂණයන් නොමැතිව, වෙබ් අඩවිය මගින් සපයනු ලබන සේවාවන් ලබා ගැනීමේ හැකියාව අඩු විය හැකි ය, නැතහොත් වෙබ් අඩවියේ කොටස් තවදුරටත් නිවැරදිව ක්‍රියා නොකරනු ඇත.

වැඩිදුර තොරතුරු සඳහා තිරයේ වම් කෙළවරේ ඇති නිල් පැහැති හරි ලකුණ මත click කරන්න.

5. වෙබ් අඩවියෙහි සමාජ මාධ්‍ය ප්ලග් ඉන් භාවිතා කරන්නේ කෙසේද?

අපගේ වෙබ් අඩවිය පහත සඳහන් සමාජ මාධ්‍ය ප්ලග් ඉන් ("plug-ins") භාවිතා කරයි:

- Meta Inc., 1601 S. California Ave., Palo Alto, CA 94304, USA මගින් බල ගැන්වෙන Facebook සහ Instagram හි Share බොත්තම සහ learn more බොත්තම
- LinkedIn Corporation, 2029 Stierlin Court, Mountain View, CA 94043, United States මඟින් මෙහෙයවනු ලබන LinkedIn හි Share බොත්තම
- YouTube Plugin, powered by Google Ireland Limited, Gordon House, Barrow Street, Dublin 4, Ireland මගින් බල ගැන්වෙන YouTube ප්ලග් ඉන්

සියලුම සමාජ මාධ්‍ය සබැඳි සහ ප්ලග් ඉන් (YouTube ප්ලග් ඉන්) අදාළ සපයන්නන් වන Facebook, LinkedIn සහ Google ("සැපයුම්කරු") යන වෙළඳ නාම සමඟින් දක්වා ඇත. දත්ත ආරක්ෂණ මට්ටම ඉහළ නැංවීමට සහ ප්ලග් ඉන් සඳහා අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව, අපි එකී සම්මුති විසඳුමක් මරේගයෙන් අතිරේක වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඔබ අපගේ වෙබ් අඩවියට පිවිසෙන විට, සැපයුම්කරුගේ සේවාදායකයන් වෙත ඔබේ බ්‍රවුසරයේ සෘජු සම්බන්ධතාවයක් ස්ථාපිත කර නොමැති බව මෙම ක්‍රියා පටිපාටිය මඟින් සහතික කරයි.

ඔබ YouTube ප්ලග් ඉන් සඳහා කුකීස් සම්මුති මනාපයන් තුළ දත්ත හුවමාරුව සඳහා ඔබේ කැමැත්ත ලබා දෙන්නේ නම් හෝ සමාජ මාධ්‍ය සඳහා සෘජු සබැඳි ක්ලික් කිරීමෙන් පමණක්, ඔබේ බ්‍රවුසරය අදාළ සැපයුම්කරුගේ සේවාදායකයට සෘජු සම්බන්ධතාවක් ඇති කරයි. ඔබේ බ්‍රවුසරය අලියාන්ස් වෙබ් අඩවියට ප්‍රවේශ වී ඇති බවට තොරතුරු සපයුම්කරුට ලැබේ. අනතුරුව ප්ලග්-ඉන් හෝ සමාජ මාධ්‍ය සපයන්නන්ගේ අන්තර්ගතය සැපයුම්කරුවන් විසින් සෘජුවම ඔබේ බ්‍රවුසරයට සම්ප්‍රේෂණය කරනු ලැබේ.

ඔබ ප්ලග් ඉන් සමඟ අන්තර්ක්‍රියා කරන්නේ නම්, උදා. imbedded යූ ටියුබ් වීඩියෝවක් වාදනය කිරීමෙන්, ඔබේ බ්‍රවුසරයෙන් සෘජුවම සැපයුම්කරු වෙත දත්ත මාරු කර සැපයුම්කරු විසින් සුරකිනු ඇත.

දත්ත රැස්කිරීමේ, සැකසීමේ සහ භාවිතයේ අරමුණ සහ විෂය පථය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර පහත රහස්‍යතා ප්‍රකාශ බලන්න;

Facebook: https://de-de.facebook.com/about/privacy/

Instagram: https://privacycenter.instagram.com/policy

LinkedIn: https://www.linkedin.com/legal/privacy-policy

Google: https://policies.google.com/privacy?hl=en-US

6. ඔබගේ පුද්ගලික දත්ත වෙත ප්‍රවේශය ඇත්තේ කාහට ද?

ඔබේ පුද්ගලික දත්ත ඉහත දක්වා ඇති අරමුණු සමග ගැළපෙන ආකාරයට සකස් කර ඇති බව අපි සහතික කරමු.

ප්‍රකාශිත අරමුණු සඳහා, ඔබේ පුද්ගලික දත්ත තෙවන පාර්ශවීය දත්ත පාලකයන් ලෙස ක්‍රියා කරන පහත පාර්ශවයන්ට අනාවරණය කළ හැක:

- රාජ්‍ය අධිකාරීන්, අනෙකුත් අලියාන්ස් සමූහයේ සමාගම්, අනෙකුත් රක්ෂණකරුවන්, සම-රක්ෂණකරුවන්, ප්‍රති-රක්ෂණ කරුවන්, රක්ෂණ අතරමැදියන්/තැරැව්කරුවන් සහ බැංකු

ප්‍රකාශිත අරමුණු සඳහා, අපගේ උපදෙස් යටතේ දත්ත සැකසුම්කරුවන් ලෙස ක්‍රියා කරන පහත පාර්ශ්ව සමඟ ද අපි ඔබේ පුද්ගලික දත්ත බෙදා ගත හැකි ය:

- අනෙකුත් අලියාන්ස් සමූහ සමාගම්, තාක්ෂණික උපදේශකයින්, විශේෂඥයින්, නීතිඥයින්, අලාභ ගැලපුම් කරන්නන්, අලුත්වැඩියා කරන්නන්, වෛද්‍යවරුන්; සහ මෙහෙයුම් සිදු කරනසේවා සමාගම් (හිමිකම් ඉල්ලීම්, තොරතුරු තාක්ෂණ, තැපැල්, ලේඛන කළමනාකරණය); සහ

- ප්‍රාදේශීය නීතිය යටතේ අවසර දී ඇති පරිදි සහ ඔබේ සන්නිවේදන මනාපයන්ට අනුකූලව ඔබට අලෙවිකරණ සන්නිවේදනය යැවීම සඳහා වෙළඳ දැන්වීම්කරුවන් සහ ප්‍රචාරණ ජාල. අපි ඔබේ අවසරයකින් තොරව අනුබද්ධ-නොවන තෙවන පාර්ශවයන් සමඟ ඔවුන්ගේ අලෙවිකරණ භාවිතය සඳහා ඔබේ පුද්ගලික දත්ත බෙදා නොගනිමු.

- බලයලත් නියෝජිතයන්, සේවා සපයන්නන් සහ පර්යේෂණ විශ්ලේෂණ ආයතන;

- පහසුකම් සපයන්නන්, උපදේශකයින් හෝ සන්නිවේදන කළමනාකරණ විශේෂඥයින් සහ අලියාන්ස් අනුග්‍රහය දක්වන විශේෂ අවස්ථා.

අවසාන වශයෙන්, අපට පහත අවස්ථා වල දී ඔබේ පුද්ගලික දත්ත බෙදා ගත හැකි ය:

- කිසියම් ප්‍රකල්පිත හෝ සත්‍ය ප්‍රතිසංවිධානයක්, ඒකාබද්ධ කිරීමක්, විකිණීමක්, හවුල් ව්‍යාපාරයක්, අන්සතු කිරීමක්, පැවරීමක් හෝ අපගේ ව්‍යාපාරයේ, වත්කම්වල හෝ කොටස්වල (ඕනෑම බංකොලොත්භාවයක් හෝ ඒ හා සමාන ක්‍රියාදාමයක් ඇතුළුව) සියලු ම හෝ ඕනෑම කොටසක වෙනත් බැහැර කිරීමක් සහ

- අප ඔබට සපයා ඇති භාණ්ඩයක් හෝ සේවාවක් පිළිබඳව ඔබ පැමිණිල්ලක් කරන්නේ නම්, අදාළ ඔම්බුඩස්මන්වරයාට ඇතුළුව ඕනෑම නීතිමය බැඳීමක් සපුරාලීමට.

- අදාළ නීතිමය හෝ නියාමන වගකීම් සපුරාලීම සඳහා නීතිය බලාත්මක කිරීමේ බලධාරීන්, ආයතන, රජය සහ නියාමන ආයතන සමඟ.

7. මගේ පුද්ගලික දත්ත සැකසෙන්නේ කොතැනින් ද?

ඉහත සඳහන් කර ඇති පරිදි පාර්ශ්වයන් විසින් දැනගත යුතු පදනම මත ඔබේ පුද්ගලික දත්ත ලොව පුරා සකසනු ලැබේ. අදාළ දත්ත ආරක්ෂණ නීති සහ රෙගුලාසිවලට අනුකූලව රහස්‍යභාවය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් ගිවිසුම්ගත සීමාවන් ක්‍රියාත්මක කරන බව අපි සහතික කරමු. අපි ඔබේ පුද්ගලික දත්ත සැකසීමට අවසර නොලබන පාර්ශ්වයන්ට හෙළි නොකරන්නෙමු.

අපි ඔබගේ පුද්ගලික දත්ත යුරෝපීය ආර්ථික ප්‍රදේශයට (EEA) සැකසීම සඳහා මාරු කරන සෑම විටම, පුද්ගලික දත්ත සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් ස්ථාපිත කරන සහ අලියාන්ස් සමූහ සමාගම් වලට නීත්‍යානුකූලව බැඳී සිටින අලියාන්ස් රහස්‍යතා ප්‍රමිතිය (Allianz BCR) ලෙස හඳුන්වන අලියාන්ස්හි අනුමත ආයතනික නීති බැඳීම් (BCRs) මත පදනම්ව අපි එය සිදු කරන්නෙමු. අලියාන්ස් රහස්‍යතා ප්‍රමිතිය සහ ඒවාට අනුකූල වන අලියාන්ස් සමූහ සමාගම් ලැයිස්තුව මෙතැනින් ලබා ගත හැක. අලියාන්ස් රහස්‍යතා ප්‍රමිතිය අදාළ නොවන විට, අපි ඒ වෙනුවට ඔබගේ පුද්ගලික දත්ත EEA වෙත මාරු කිරීමේ දී එය ශ්‍රී ලංකාවේ සිදුකරනවාක් මෙන් ප්‍රමාණවත් මට්ටමේ ආරක්ෂාවක් ලබා ගැනීම සහතික කිරීමට පියවර ගන්නෙමු.

8. ඔබගේ පුද්ගලික දත්ත සම්බන්ධයෙන් ඔබගේ අයිතිවාසිකම් මොනවා ද?

අදාළ නීතිය හෝ රෙගුලාසි මගින් අවසර දී ඇති විට,ඔබට පහත කරුණු සම්බන්ධයෙන් අයිතිය හිමි වේ:

- ඔබ පිළිබඳව තබා ඇති ඔබේ පුද්ගලික දත්ත වෙත ප්‍රවේශ වී දත්තවල මූලාරම්භය, සැකසීමේ අරමුණු සහ අවසානය, දත්ත පාලකය(පාලක), දත්ත සකසනය(සකසන) සහ දත්ත අනාවරණය කළ හැකි පාර්ශ්ව පිළිබඳ තොරතුරු අධ්‍යයනය;
- ඔබේ අවසරය ඇතිව ඔබගේ පුද්ගලික දත්ත සැකසෙන ඕනෑම අවස්ථාවක ඔබගේ කැමැත්ත ඉල්ලා අස්කර ගැනීම;
- ඔබගේ පුද්ගලික දත්ත සැමවිටම නිවැරදි වන පරිදි යාවත්කාලීන කිරීම හෝ නිවැරදි කිරීම;
- ඉහත දක්වා ඇති අරමුණු සඳහා ඔබගේ පුද්ගලික දත්ත තවදුරටත් අවශ්‍ය නොවන්නේ නම් අපගේ වාර්තා වලින් මකා දැමීම;
- යම් යම් තත්වයන් යටතේ ඔබේ පුද්ගලික දත්ත සැකසීම සීමා කිරීම, උදාහරණයක් ලෙස ඔබ ඔබේ පුද්ගලික දත්තවල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් තරහ කර ඇති අවස්ථාවක, එහි නිරවද්‍යතාවය සත්‍යාපනය කිරීමට අපට හැකියාව ලබාදෙන කාල සීමාව සඳහා;

- ඔබ වෙනුවෙන් හෝ ඔබේ නව රක්ෂණකරු සඳහා ඔබේ පුද්ගලික දත්ත විද්‍යුත් ආකෘතියකින් ලබා ගැනීම;
- අප වෙත හා/හෝ අදාළ දත්ත ආරක්ෂණ අධිකාරියට පැමිණිල්ලක් ගොනු කිරීම

[ඉහත අයිතීන් ක්‍රියාවේ යෙදවීම සඳහා, මෙහි click කරන්න]

9. ඔබගේ පුද්ගලික දත්ත සැකසීමට ඔබට විරුද්ධ විය හැක්කේ කෙසේ ද?

අදාළ නීති හෝ රෙගුලාසි මඟින් අවසර දී ඇති විට, ඔබේ පුද්ගලික දත්ත සැකසීමට අපට විරුද්ධ වීමට හෝ (ඍජු අලෙවිකරණ කාර්යයන් ද ඇතුළුව) එය සැකසීම නතර කරන ලෙස අපට පැවසීමට ඔබට අයිතියක් ඇත. ඔබ මෙම ඉල්ලීම පිළිබඳව අපට දැනුම් දුන් පසු, අදාළ නීති සහ රෙගුලාසි මගින් අවසර ලබා දී ඇත්නම් මිස, අපි ඔබේ පුද්ගලික දත්ත තවදුරටත් ක්‍රියාවට නංවන්නේ නැත.

ඉහත දක්වා ඇති ඔබගේ අනෙකුත් අයිතීන් සඳහා භාවිත වන ආකාරයෙන් ම ඔබට මෙම අයිතිය භාවිතා කළ හැක.

10. අපි ඔබේ පුද්ගලික දත්ත කොපමණ කාලයක් තබා ගන්නේ ද?

අපි ඔබගේ පුද්ගලික දත්ත තබා ගැනීමට බැඳී සිටින්නේ දත්ත රැස් කරන ලද අරමුණු ඉටු කිරීමට හෝ නීතිමය වගකීම් ඉටු කිරීමට අවශ්‍ය තාක් කල් පමණි.

අපි ඔබගේ පුද්ගලික දත්ත අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි කාලයක් රඳවා නොගන්නා අතර එය රඳවා තබා ගන්නේ ඒවා ලබාගත් අරමුණු සඳහා පමණි.

11. ඔබගේ පුද්ගලික දත්ත ලබා නොදීමේ ප්‍රතිවිපාක මොනවා ද?

- ඔබගේ යෝජනා ආකෘති පත්‍රය සැකසීමට සහ/හෝ අපට ඔබ වෙනුවෙන් අපගේ නිෂ්පාදන සහ/හෝ සේවා සැපයීමට නොහැකි වීමට හේතු වේ.
- අපගේ නිෂ්පාදන සහ/හෝ සේවා පිළිබඳ ඔබගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට අපට නොහැකි වීමට හේතු වේ.
- අපගේ වෙබ් අඩවිය, වෙබ් සබැඳි හෝ ඩිජිටල් වේදිකාවල ඇතැම් විශේෂාංග වෙත ප්‍රවේශය සීමා කිරීම හෝ වැළැක්වීම
- කිසියම් ප්‍රවර්ධනයක්, අපගේ සේවාවන්/නිෂ්පාදන හෝ දියත් කිරීම් සම්බන්ධ නවතම යාවත්කාලීන පිළිබඳව ඔබව යාවත්කාලීන කිරීමට අපට නොහැකි වීමට හේතු වේ.
- අප විසින් සංවිධානය කරන ලද ප්‍රවර්ධන කටයුතු සඳහා ඔබට ආරාධනා ලැබීමට නොහැකි වීමට හේතු වේ.
- ඔබ සමඟ සන්නිවේදනය කිරීමට අපට ඇති හැකියාව සම්බන්ධයෙන් ඍණාත්මක බලපෑම
- එවැනි පුද්ගලික දත්ත රැස් කිරීමට අපට අවශ්‍ය වන කිසියම් අදාළ නීතියක් හෝ රෙගුලාසියක් උල්ලංඝනය වීම

12. ඔබට අපව සම්බන්ධ කර ගත හැක්කේ කෙසේද?

අපි ඔබගේ පුද්ගලික දත්ත භාවිතා කරන ආකාරය සම්බන්ධයෙන් ඔබට කිසියම් විමසීමක් සිදු කිරීමට අවශ්‍ය නම්, ඔබට පහත පරිදි දුරකථනයෙන්, විද්‍යුත් තැපෑලෙන් හෝ තැපැල් මගින් අප හා සම්බන්ධ විය හැකි ය;

අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමටඩ්
දත්ත ආරක්ෂණ නිලධාරි
නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව
26-27 මහල,
වන් ගෝල්ෆේස් කුළුණ,
අංක 1A, මැද පාර, ගාලු මුවදොර,
කොළඹ 02, ශ්‍රී ලංකාව
0112 132 008
privacy@allianz.lk

13. අපි කොපමණ වාරයක් මෙම රහස්‍යතා නිවේදනය යාවත්කාලීන කරන්නේද?

අපි මෙම රහස්‍යතා නිවේදනය නිතිපතා සමාලෝචනය කරන්නෙමු. ඔබට බලපෑම් ඇති කළ හැකි වැදගත් වෙනසක් පවතින විට අපි ඔබට ඒ බව සෘජුව ම දැනුම් දෙන්නෙමු.

අවසන්වරට යාවත්කාලීන කිරීම–2025 අගෝස්තු